# කිතුල් සංවර්ධන මණ්ඩලය

## (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය)

**යහපත් නිපැයුම් පරිචය ( GMP) පිළිබඳ සහතික සඳහා රජයේ සහන**

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිතුල් සංවර්ධන මණ්ඩලය විසින් කිතුල් කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයන් දිරි ගැන්වීමත් කර්මාන්තයේ ඵලදායීතාව වර්ධනය කිරීම සහ පාරිභෝගිකයන්ට වෙළෙඳපොල තුල තත්ත්වයෙන් උසස් කිතුල් නිෂ්පාදන ලබා ගැනීමට අවස්ථාව සැලසීම සඳහා විශේෂ අනුග්‍රහයක් ලබා දීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත.

මේ සඳහා 2025 ජනවාරි 01 දිනට වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 50ට අඩු සහ සේවක සංඛ්‍යාව 50ට අඩු පහත සඳහන් කිතුල් කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා GMP තත්ත්ව සහතික ලබා ගැනීමට අයදුම් කළ හැකිය.

- කිතුල් පැණි
- කිතුල් හකුරු
- කිතුල් ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන
- කිතුල් පිටි සහ කිතුල් පිටි ආශ්‍රිත වෙනත් නිෂ්පාදන

### ප්‍රතිලාභ :-

- තෝරාගත් කර්මාන්ත සඳහා සහතිකපත් ගාස්තු වලින් 60% ක්, උපරිමය රු75,000/-ක් දක්වා සහතිකපත් ගාස්තු ගෙවීම් කරන අතර සහතිකපත් සහ අදාල බිල්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගාස්තු ප්‍රතිපූර්ණය කරනු ලැබේ.
- වැඩසටහන ක්‍රියාත්මක කරන කාලය තුල අවශ්‍ය උපදේශනය හා මඟපෙන්වීම සිදු කරනු ලැබේ.

### යෝග්‍යතාවය :-

1. දැනට නිෂ්පාදනයේ නිරත කර්මාන්ත සඳහා,
   - අවම වශයෙන් අවු. 01 ක නිෂ්පාදන වාර්තා ඉදිරිපත් කල යුතුය.
   - ඉල්ලුම්පත් යොමු කරන අවස්ථාවේදී කර්මාන්තය සාර්ථකව ක්‍රියාත්මක විය යුතුය.
   - අයදුම්පත් යොමු කරන අවස්ථාව වන විට අදාළ සහතික ලබාගැනීම සඳහා සහතිකකරණ ආයතන වෙත අයදුම් නොකළ කර්මාන්තයක් විය යුතුය.
2. නව ආයෝජන සඳහා,
   - නව ව්‍යාපෘති යෝජනාව විස්තරාත්මකව ඉදිරිපත් කල යුතුය
   - ඔක්තෝබර් මස 31 දිනට පෙර නිෂ්පාදන ආරම්භ කල යුතුය
   - දෙසැම්බර් 10 දින වන විට සහතිකකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කල යුතුය

### තෝරාගැනීමේ ක්‍රියාවලිය :-

- පුවත්පත් දැන්වීමේ සඳහන්ව ඇති කොන්දේසි මත සම්මුඛ පරීක්ෂණයේදී තහවුරු කරගන්නා කරුණු මත ඉහත ක්ෂේත්‍රයන්ට අදාළ නිෂ්පාදන කර්මාන්ත තෝරා ගැනීම සිදු කෙරේ.

## අනෙකුත් කොන්දේසි :-

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් (SLSI) හෝ ශ්‍රී ලංකා ප්‍රතීතකරණ මණ්ඩලයේ ( SLAB) ප්‍රතීතකරණය ලද සහතිකකරණ ආයතනයකින් සහතිකපත් ලබාගත යුතුය.
- සහතිකපත් සහ බිල්පත් 2025/12/10 දිනට හෝ එදිනට පෙර කිතුල් සංවර්ධන මණ්ඩලය වෙත ඉදිරිපත් කර අදාළ සහතිකපත් ගාස්තු ප්‍රතිපූර්ණය කරගත යුතුය.
- අදාළ කර්මාන්තය සහතිකකරණ ක්‍රියාවලිය සිදුවන කාලය තුළ වෙනත් රජයේ ආයතනයකින් මෙයට සමාන ප්‍රතිලාභ ලබා නොගත යුතුය.
- තෝරාගන්නා අයදුම්කරුවන් නියමිත දිනට ප්‍රථම තම ආයතනයේ සහතිකකරණ ක්‍රියාවලිය අවසන් කරන බවට කිතුල් සංවර්ධන මණ්ඩලය සමඟ එකඟතා ගිවිසුමකට යටත් විය යුතුය.
- දේශීය කර්මාන්තයක් විය යුතු අතර දේශීය හවුල්කරු සමාගමෙන් අවම වශයෙන් 60%ක හිමිකාරීත්වයක් තිබිය යුතුය.

## අයදුම් කිරීම :-

පහත සඳහන් QR කේතය මගින් හෝ ගූගල් දිගුව මගින් හෝ අතින් සකස් කර ගන්නා ලද අයදුම් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2025 මැයි මස 15 දිනට ප්‍රථම කිතුල් සංවර්ධන මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය.

**QR Code**

**Google link :-**

https://docs.google.com/forms/d/e/1FAIpQLSdxSMNdsx4UYRk1F5EOvI6aaJcfft_iMA6GSarfuFEAvjQjVA/viewform?usp=dialog

## ලිපිනය :-

සභාපති, කිතුල් සංවර්ධන මණ්ඩලය, අංක 45, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

## වැඩි විස්තර :-

දුරකථන - 0112441849/ 0773619604

Emai -genkdb1@gmail.com

website – www.kdb.gov.lk

මගින් ලබා ගත හැක.